# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2012 මැයි මස 18 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2012.05.21 දින නිකුත් කරන ලදී)**

## මෙඩිසිනා ඕල්ටනේටිවා ආයතනය (සංස්ථාගත කිරීමේ)

(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම් පතකි)

**මෙඩිසිනා ඕල්ටනේටිවා ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## මෙඩිසිනා ඕල්ටනේටීවා ආයතනය
## (සංස්ථාගත කිරීමේ)

**මෙඩිසිනා ඕල්ටනේටීවා ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

*පූර්විකාව.*

"මෙඩිසිනා ඕල්ටනේටීවා ආයතනය" යනුවෙන් හඳුන්වනු ලබන වෛද්‍ය ආයතනයක් (මෙය දේශීයව විදේශීයව විසිර සිටින වෛද්‍යවරුන්ගෙන් සමන්විත වන්නේ ය) එම ආයතනයේ අරමුණු සාකල්‍යයෙන්ම ඵලදායි ලෙස ඉටු කර ගැනීම සහ එකී මෙඩිසිනා ඕල්ටනේටීවා ආයතනය හා සම්බන්ධ සියලුම කාරණා පිළිබඳව එම ආයතනයේ සාමාජිකයන් විසින් එකඟ වී ඇති රීතිවලට අනුව කටයුතු කිරීම සඳහා මේ වන විටත් පිහිටුවා ගෙන ඇති හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

*ලුහුඬු නාමය.*

1. මේ පනත 2012 අංක      දරන මෙඩිසිනා ඕල්ටනේටීවා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*මෙඩිසිනා ඕල්ටනේටීවා ආයතනය සංස්ථාගත කිරීම.*

2. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) මෙඩිසිනා ඕල්ටනේටීවා ආයතනයේ ව්‍යවස්ථාව අනුව ඡන්දයෙන් පත්කර ගන ලබන සාමාජිකයන් සහ ඔවුන්ගේ අනුප්‍රාප්තිකයන් සහ (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) මෙඩිසිනා ඕල්ටනේටීවා යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද, සියලු අධිකරනවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගෙන එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

*සංස්ථාවේ පොදු පරමාර්ථ*

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) වෛකල්පිත වෛද්‍ය විද්‍යාව දේශීයව හා විදේශීයව ප්‍රචලිත කිරීම හා නොමිළයේ අධ්‍යාපනය ලබා දීම ;

(ආ) දිළිඳු හා සරණ ලැබිය යුතු රෝගීන් හට වෛකල්පිත වෛද්‍ය ක්‍රම තුළින් නොමිළයේ ප්‍රතිකාර කිරීම ;

(ඇ) දිළිඳු දරුවන්ගේ අධ්‍යාපන කටයුතු නංවාලීමට පහසුකම් සැපයීම ;

(ඈ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කරගැනීම පිණිස දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, ආයුර්වේද දෙපාර්තමේන්තුව සහ වෙනත් අදාළ රජයේ සහ රාජ්‍ය අනුබද්ද ආයතන සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම ;

(ඉ) සාමාජික, ආර්ථික, අධ්‍යාපනික හා සංස්කෘතික කටයුතුවල නිරත වී සිටින වෙනත් අදාළ ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම ;

(ඊ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා මුද්‍රිත හා අනෙකුත් මාධ්‍ය කටයුතු හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ;

(උ) සංස්ථාවේ සියලු පරමාර්ථ හෝ ඉන් කිසිවක් හෝ මුදුන්පත් කර ගැනීමට අවශ්‍ය වන හෝ හිතකර වන හෝ ආනුෂංගික වන වෙනත් කවර හෝ කර්තව්‍යයන් සහ වෙනත් දේ ඉටු කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව බැංකු ගිණුමේ විවෘත කිරීමේ පවත්වාගෙන යාමේ හා වසා දැමීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබාගැනීමේ ද දේශීය හෝ විදේශීය ප්‍රභවවලින් සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීමේද, දේපල අත්පත් කර ගැනීමේ හා මිලදී ගැනීමේ ද, සංස්ථාව වෙත පවරා දී ඇති හෝ සංස්ථාව විසින් අත්කර ගෙන ඇති හෝ සංස්ථාව විසින් දරනු ලබන යම් ඉඩමක ගොඩනැගිලි කිසිවක් ඉදිකිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය නිළධරයන් හා සේවකයන් සේවයෙහි යෙදවීමේ හා සේවයෙන් ඉවත් කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථවේ පරමාර්ථ ඉටු කිරීමට හෝ සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය හෝ හිතකර හෝ උචිත කවර වූ හෝ සියලු කටයුතු, කාරණා සහ සියලු දේ ඉටු කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

5\. (1) සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා නීතිරීතිවලට යටත්ව එහි කටයුතු කළමනාකරණය එම නීති රීතිවලින් ඉඩ සලසා ඇති පරිදි ඒ අනුව තෝරා පත් කර ගනු ලබන විධායක සභාවක් මගින් ඉටු කෙරෙන්නේ ය. සංස්ථාවේ පරිපාලනය.

(2) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථයන් මුදුන්පත් කර ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ මෙම පනතේ මෙන්ම වෙනත් කිසියම් ලිඛිත නීතියක ප්‍රතිපාදනවලට පටහැනි නොවන කවර හෝ රෙගුලාසි වරින් වර පැවැත්වෙන මහා සභා රැස්වීමක දී පැමිණ සිටින සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට (2/3 කට) නොඅඩු ඡන්දයෙන් සම්මත කර ගැනීම නීත්‍යානුකූල වේ. එබඳු රීති එවැනි රැස්වීමක දී ඒ ආකාරයෙන් ම වෙනස් කිරීම සංශෝධනය කිරීම පරිච්ඡින්න කිරීම හෝ ඒවාට අලුතින් යමක් එක් කිරීම ද කළ හැක්කේ ය.

(3) ප්‍රථම විධායක සභාව මෙම ආයතනය සංස්ථාගත කෙරෙන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී තනතුරු දැරූ සාමාජිකයන්ගෙන් සමන්විත වන්නේ ය.

(4) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී, ආයතනයේ බලපැවැත්වුණු රීති මේ පනතේ හෝ වෙනයම් ලිඛිත නීතියක විධිවිධානවලට පටහැනි නොවන තාක් දුරට මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති වශයෙන් සලකනු ලැබිය යුත්තේ ය.

(5) සංස්ථවේ සෑම සාමාජික සාමාජිකාවක්ම සංස්ථාවේ තත්කාලයේ පවත්නා රීතිවලට යටත්විය යුත්තේ ය.

6\. (1) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී ආයතනයේ පැවැති සියලුම ණයකම් හා බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, ආයතනයට ගෙවිය යුතු සියලු ණය සහ සාමාජික මුදල් හා දායක මුදල් මේ පනතේ කාර්යයන් සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුත්තේ ය. සංස්ථාවේ වත්කම් හා බැරකම්.

(2) සාමාජිකයකුගෙන් අය විය යුතු යාවජීව සාමාජික මුදල් හෝ වාර්ෂික සාමාජික මුදල් ඉක්ම වූ කිසිදු මුදල් ප්‍රමාණයක් සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්ය සඳහා ගෙවීමට කිසිදු සාමාජිකයකු බැඳී නොමැත්තේ ය.

සංස්ථාවට චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**7.** යම් මිලදී ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු නීයාදනයකින් හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව වෙත සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් සංස්ථාවේ රීතිවලට යටත්ව, භාරගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙන් බලය හා හැකියාව ඇත්තේ ය. තව ද, එවැනි සියලු දේපල මේ පනතේ කාර්යයන් සඳහා බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ද සංස්ථාව සතුවේ.

සංස්ථාවේ අරමුදල.

**8.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ සංස්ථාව වෙනුවෙන් මෙතෙක් ලැබුණා වූ හෝ මින්මතු ලැබෙන ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන සංස්ථාව විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ නමට තැන්පත් කරනු ලැබිය යුත්තේ ය.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්යයන් සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් පියවීමට අවශ්‍ය මුදල් මෙකී අරමුදලින් ගෙවිය යුතු ය.

(3) සංස්ථාවේ මුදල් හා දේපළ කවර ආකාරයකින් ලැබුණ ද මෙහි දක්වා ඇති පරිදි හුදෙක් ම සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා පමණක්ම යෙදිය යුත්තේ ය.

ගිණුම් සහ විගණනය.

**9.** (1) සංස්ථාවට ලැබුණු හෝ සංස්ථාව විසින් වියදම් කරනු ලැබූ සියලු මුදල් පිළිබඳ සංස්ථාව විසින් නිසි අයුරින් ගණන් තැබීමට සැලැස්විය යුතු ය.

(2) සංස්ථාව විසින් පත්කරනු ලද ලියාපදිංචි විගණකවරයකු හෝ විගණකවරයන් විසින් සෑම වසරක දී ම යටත් පිරිසෙයින් එක් වරක්වත් සංස්ථාවේ ගිණුම් පරීක්ෂා කොට විගණනය යුතු අතර, ආදායම් හා වියදම් ගිණුමෙහි සහ ශේෂ පත්‍රයෙහි නිරවද්‍යතාව තහවුරු කළ යුත්තේ ය.

සංස්ථාවේ මුද්‍රාව.

**10.** සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ ලේකම් භාරයේ තිබිය යුතු අතර, සංස්ථාවේ සභාපති හෝ ලේකම් හෝ සංස්ථාව විසින් නිසි පරිදි බලය පවරනු ලැබූ වෙන් පුද්ගලයකු ඉදිරිපිට දී විනා එය කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. එකී තැනැත්තන් තමා පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම අත්සන තැබිය යුතු ය. එම අත්සන් කිරීමේ සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් තබනු ලබන අත්සන්වලට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**11.** මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් වෙතින්, ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර, ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනයම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

සංස්ථාව විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

**12.** සංස්ථාව විසුරුවා හරින විටක සංස්ථාවේ සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර වුව ද දේපලක් ඉතිරි වුවහොත්, ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා නොදිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය ආදායම හෝ දේපල කිසිවක් තම සාමාජිකයන් අතර බෙදා දීම එහි රීති මගින් තහනම් කොට ඇත්තා වූ ද, වෙනත් යම් සංගමයකට හෝ සංගම්වලට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතුය. ඒ සංගමය හෝ සංගම් කවරේදැයි සංස්ථාවේ සාමාජිකයන් විසින්, සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුව ම තීරණය කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**13.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.